# Grade 8 Art

## යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර

- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර ක්‍රිස්තු පූර්ව 40,000- ක්‍රිස්තු පූර්ව 10,000න් අතර කාලයට අයත් යැයි සැලකේ.
- ගුහා තුළ ජීවත් වූ ආදි මානවයන් එදිනෙදා ජීවිතයේ ලැබූ අත්දැකීම් ගුහා බිත්ති මත සිතුවම් කොට තිබේ. මේවා අතර සත්ත්ව රූප, මානව රූප, ජ්‍යාමිතික හැඩතල, සහ විවිධ සංකේත ද වේ.
- යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ චිත්‍ර ඇති ස්ථාන අතරින් ප්‍රංශයේ ලැස්කෝ, ස්පාඤ්ඤයේ ඇල්ටමයිරා ගුහාව, ෆොන්ඩිගෝම් ගුහාව, කොගුල් ගුහාව ප්‍රධාන තැනක් ගනී.
- මෙම චිත්‍ර නිර්මාණ කිරීම සඳහා ශිල්ප ක්‍රම කිහිපයක් භාවිත කොට තිබේ. එම ශිල්ප ක්‍රම අනුව ප්‍රාග් ඓතිහාසික සිතුවම් ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්විය හැකි ය.
    - රේඛා චිත්‍ර - (Line drawing)
    - වර්ණ සිතුවම් - (Painting)
    - ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප (Engraving)
    - අත් සලකුණු - (Hand prints)
- චිත්‍ර වර්ණ ගැන්වීම සඳහා පරිසරයෙන් සොයාගත් ස්වාභාවික ද්‍රව්‍ය වන අඟුරු, කිරිමැටි, සත්ත්ව ලේ, හිරිගල්, පස් යනාදිය භාවිත කර ඇති අතර ඒවා ජලය, මැලියම් නැතහොත් සත්ත්ව ලේ සමග මිශ්‍ර කර ඇත.
- එමෙන් ම මෙම චිත්‍ර සඳහා කළු, අඳුරු රතු, දුඹුරු, අළු, සුදු යන වර්ණ බහුල ලෙස භාවිත කොට තිබේ.

## ඇල්ටමීරා ගුහා චිත්‍ර






- ඇල්ටමීරා ගුහා චිත්‍ර ස්පාඤ්ඤයට අයත් ය.
- මෙහි ඇති සිතුවම් ක්‍රිස්තු පූර්ව 15.000- 10.000ට පමණ අයත් යැයි සැලකේ.
- මෙම ගුහාවේ රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප සහ අත් සලකුණු වශයෙන් ශිල්ප ක්‍රම කිහිපයක ම නිර්මාණ දැකිය හැකි ය.
- මෙහි ඇති චිත්‍ර අතර බයිසන් රූප, අශ්ව රූප, පිනිමුවන් සහ වල් ඌරන් ගේ රූප සහ විවිධ සංකේත සහ ජ්‍යාමිතික හැඩතල ද වේ.
- මේවා සියල්ල රතු, දුඹුරු, කළු සහ සුදු යන වර්ණවලින් වර්ණ කොට තිබෙන අතර ඇතැම් සිතුවම් සඳහා කළු පැහැති බාහිර රේඛාවක් යොදා තිබේ.

## ලැස්කෝ ගුහා චිත්‍ර






- ප්‍රංශයේ මොන්ටිනැක් නුවර අසල ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් සඳහා ප්‍රසිද්ධියක් උසුලන ලැස්කෝ (Laxcaus) ගුහා පිහිටා ඇත.
- මෙහි ඇති සිතුවම් ක්‍රිස්තු පූර්ව 15.000 -13.000 අතර කාලයට අයත් යැයි සැලකේ.
- මෙම ගුහාවේ රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, ගල් බිත්තිය හාරා නිර්මාණය කරන රූප, අත් සලකුණු ආදි ශිල්ප ක්‍රම කිහිපයක ම නිර්මාණ දැකිය හැකි ය.
- මෙහි ඇති චිත්‍ර අතර සත්ත්ව රූප, මානව රූප සහ විවිධ සංකේත සහ ජ්‍යාමිතික හැඩතල ද වේ. මේ අතර බයිසන් රූපය විශාල වශයෙන් ඇඳ තිබේ.
- ලැස්කෝ ගුහාවේ චිත්‍ර අතර අඩි 17ක් දිග බයිසන් ගව රූපය විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකේ.
- ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන් ගේ රුව සහ බිම වැතිරී සිටින මිනිසකුගේ රුව සහිත චිත්‍රය ( Hunting Scene) මෙම ගුහාවේ ඇති වැදගත් චිත්‍රයක් ලෙස සැලකේ.